විභාග අංකය :

………………………………

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
# දීප ව්‍යාප්ත භාෂා පුහුණු වැඩසටහන
# අවසාන විභාගය, 2007 (2008)

## සිංහල භාෂාව මට්ටම II (නව නිර්දේශය)

**ප්‍රශ්න පත්‍ර අංක 2**

2008.03.15

**කාලය පැය තුනයි.**

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

1. පහත සඳහන් නාමවචනවල බහුවචන දක්වන්න.

(i) කන්තෝරුව …………………………………

(ii) මාර්ගය …………………………………

(iii) පහන …………………………………

(iv) ලිපි ගොනුව …………………………………

(v) අධ්‍යක්ෂවරයා …………………………………

(vi) ලිපිකරුවා …………………………………

(vii) වෛද්‍යවරයා …………………………………

(viii) ආරක්ෂක නිලධරයා …………………………………

(ix) ගණකාධිකාරිතුමා …………………………………

(x) සේවායෝජකයා …………………………………

2. පහත සඳහන් නාමවචනවල ඒකවචන දක්වන්න.

(i) කොමසාරිස්වරු ………………………………..

(ii) පරීක්ෂණ ………………………………..

(iii) උපවගන්ති ………………………………..

(iv) වාරික ………………………………..

(v) ආයතන ………………………………..

(vi) ඡේද ……………………………….

(vii) ව්‍යාපාර ……………………………….

(viii) ආයෝජකයෝ ……………………………….

(ix) අමාත්‍යවරු ………………………………

(x) කර්තව්‍යය ………………………………

3. පහත සඳහන් වාක්‍යවල ඇති විශේෂණ පද සලකුණු කරන්න.

උදා : <u>දක්ෂ</u> සේවකයා පැමිණෙයි.

(i) කාර්යක්ෂම නිලධාරියා සේවයට පැමිණෙයි.

(ii) එය නවතම කාර්යාලයකි.

(iii) අභිනව අධ්‍යක්ෂවරයා ලිපිකරුවන් ඇමතීය.

(iv) සියලු දෙනා අලුත් නියෝග පිළිබඳව දැනගත යුතුය.

(v) ශ්‍රී ලංකාව පොහොසත් රටක් නොවේ.

4. පහත සඳහන් වාක්‍යවල ඇති වර්තමාන කාලයට අයත් ක්‍රියා අතීත කාලයට හරවන්න.

(i) විනය බලධරයා සියලු වාර්තා සලකා බලයි.

……………………………………………………………………………………..

(ii) ලේකම්වරයා තොරතුරු ලේඛනගත කරයි.

……………………………………………………………………………………..

(iii) සේවකයෝ අතුරු නියෝග පිළිගනිති.

……………………………………………………………………………………..

(iv) විනිසුරු විසින් තීන්දුව ප්‍රකාශ කරනු ලැබේ.

……………………………………………………………………………………..

(v) අලුත් පනත නිසා සියලු පැරණි පනත් අවලංගු වෙයි.

……………………………………………………………………………………..

5. පහත සඳහන් වාක්‍යයේ ඇති සියලු නිපාත සලකුණු කරන්න.වාක්‍යයේ පළමු නිපාතය සලකුණු කොට ඇත.

ප්‍රාදේශීය ලේකම්වරයෙකුගේ කොට්ඨාසයක් සංයුක්ත වන <u>යම්</u> ප්‍රදේශයක, අවස්ථාවෝචිත පරිදි, සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ භාවිත කරන සුළු ජන කොට්ඨාසය ඒ ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් අටෙන් එකකට වඩා වැඩිවන්නේ නම්, ඒ ප්‍රදේශයේ පිහිටා ඇති ජාතික හා පළාත් ආයතන, සහ පළාත් පාලන ආයතන විසින් පොදු වාර්තා පවත්වා ගෙන යාමේ භාෂා වශයෙන් සිංහල භාෂාව සහ දෙමළ භාෂාව භාවිත කළ යුත්තේ ය.

6. පහත සඳහන් වාක්‍ය **නැත** යන අර්ථය ඇති වාක්‍ය බවට පෙරළන්න.

(i) අද මම කන්තෝරුවට යනවා

……………………………………………………………………………………..

(ii) ප්‍රධාන ලිපිකරු සියලුම ලියුම් බැලුවා.

……………………………………………………………………………………..

(iii) වරාය අධිකාරියේ සේවකයෝ දක්ෂයි.

……………………………………………………………………………………..

(iv) සියලුම ගුරුවරු රැස්වීමට ආවා

……………………………………………………………………………………..

(v) විත්තිකරුවෝ උසාවියට අපහාස කළා.

……………………………………………………………………………………..

7. පහත සඳහන් වාක්‍ය ලිඛිත සිංහලයට පෙරළන්න.

(i) ලේකම්තුමා සභාව ඇමතුවා

……………………………………………………………………………………..

(ii) මන්ත්‍රීතුමා සේවකයන් උනන්දු කරනවා.

……………………………………………………………………………………..

(iii) කම්කරුවෝ වෙලාවට එනවා.

……………………………………………………………………………………..

(iv) මේ ඉස්කෝලෙ හුඟක් ළමයි ඉන්නවා.

……………………………………………………………………………………..

(v) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හොඳට වැඩ කරනවා.

……………………………………………………………………………………..

8. පහත සඳහන් වාක්‍ය වැරදි නම් නිවැරදි කරන්න.

(i) රටවැසියන් මන්ත්‍රීවරු තෝරා ගනිති.

……………………………………………………………………………………..

(ii) විගණකාධිපතිවරයා විසින් සියලුම වාර්තා පරීක්ෂා කරයි

……………………………………………………………………………………..

(iii) අග්‍රවිනිශ්වකාරතුමා තීන්දුව ප්‍රකාශයට පත් කරති.

……………………………………………………………………………………..

(iv) ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව අර්ථ නිරූපනය කරයි.

……………………………………………………………………………………..

(v) ගුරුවරුන් ළමුනට පාඩම් කියා දෙති.

……………………………………………………………………………………..

9. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) අග්‍රාමාත්‍යවරයා සම්මේලනය විවෘත කළේය.

……………………………………………………………………………………..

(ii) අග්‍රවිනිශ්චයකාරවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් නම් කළේය.

……………………………………………………………………………………..

(iii) නිලධාරීහු අධ්‍යාපන පද්ධතිය ක්‍රමවත්ව කරති.

……………………………………………………………………………………..

(iv) විදුහල්පතිවරයා අලුත් ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කළේය.

……………………………………………………………………………………..

(v) ප්‍රාදේශීය සභාව, තම ප්‍රදේශයේ කර්මාන්ත සම්බන්ධයෙන් නව බද්දක් පැනවීය.

……………………………………………………………………………………..

10. පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකට හරවන්න.

(i) ගෑස් බෙදාහැරීම රජය විසින් ආරම්භ කරනු ලැබේ.

……………………………………………………………………………………..

(ii) නව ක්‍රීඩා සංකීර්ණයක් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ආරම්භ කෙරිණි.

……………………………………………………………………………………..

(iii) මෙම ප්‍රදේශය හරිත ප්‍රදේශයක් බව පරිසර අමාත්‍යාංශය විසින් නම් කරනු ලැබේ.

……………………………………………………………………………………..

(iv) සියලු චූදිතයෝ විනිසුරුවරයා විසින් නිදහස් කරනු ලැබූහ.

……………………………………………………………………………………..

(v) පරීක්ෂණ වාර්තාව විනය බලධරයා විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට යවන ලදී.

……………………………………………………………………………………..

11. පහත සඳහන් වාක්‍ය දෙමළ භාෂාවට **හෝ** ඉංග්‍රීසි භාෂාවට **හෝ** පරිවර්තනය කරන්න.

(i) ඔහු කාර්යාලයට පැමිණෙන්නේ උදෑසනය.

……………………………………………………………………………………..

(ii) කාර්යක්ෂම නිලධාරියා තම රාජකාරී කටයුතු නිම කරයි.

……………………………………………………………………………………..

(iii) සියලු දෙනාටම නිදහස් අධ්‍යාපනය ලැබිය යුතුය.

……………………………………………………………………………………..

(iv) ඇතැම්හු පෞද්ගලික පාසැල්වලට කැමැත්තක් දක්වති.

……………………………………………………………………………………..

(v) රටවැසියන්ට සාමයෙන් ජීවත් වීමට අවශ්‍යය.

……………………………………………………………………………………..

(vi) කලට වේලාවට සේවයට නොපැමිණීම විනය විරෝධීය.

……………………………………………………………………………………..

(vii) රාජ්‍ය සේවකයන් ආචාර සම්පන්න විය යුතුය.

……………………………………………………………………………………..

(viii) සියලු නිලධරයන්ට විශ්‍රාම ගැනීමේදී පාරිතෝෂික දීමනාවක් හිමි විය.

……………………………………………………………………………………..

(ix) ජාතික අධ්‍යාපන කොමිසම නව යෝජනා ඉදිරිපත් කළේය.

……………………………………………………………………………………..

(x) නව වැටුප් සංශෝධනය සේවකයන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

……………………………………………………………………………………..

12. පහත සඳහන් දෙමළ වාක්‍ය <u>හා</u> ඉංග්‍රීසි වාක්‍ය, සිංහල භාෂාවට පරිවර්තනය කරන්න.

(i) நீங்கள் எல்லோரும் நாளைக்கு வாருங்கள்.

……………………………………………………………………………………..

(ii) அது மிகவும் அழகான வீடு

……………………………………………………………………………………..

(iii) தம்பி என்னோடு கண்டிக்கு வருவார்

……………………………………………………………………………………..

(iv) அப்பா வீட்டில் இருக்கிறார்

……………………………………………………………………………………..

(v) அந்த ஊரில் ஒரு கோயில் இருக்கிறது

……………………………………………………………………………………..

(vi) நான் தமிழில் உள்ள எல்லா இலக்கியங்களையும் படிக்க விரும்புகிறே

……………………………………………………………………………………..

(vii) இப்பொழுது தமிழ் வகுப்புகள் பல இடங்களில் நடைபெறுகின்றன.

……………………………………………………………………………………..

(viii) இந்தக்கடையில் சாமான்கள் விற்பனைக்கு உண்டு

……………………………………………………………………………………..

(ix) நான் சொன்னதை எனது தம்பியிடம் சொல்ல வேண்டாம்

……………………………………………………………………………………..

(x) இந்தப் புத்தகங்களுள் இது நல்லது

……………………………………………………………………………………..

(i) Sri Lanka is an independent and sovereign republic

……………………………………………………………………………………..

(ii) Your appointment will take effect from the date on which you assume duties.

……………………………………………………………………………………..

(iii) If you are not certified as physically fit to serve in any past of the Island, your appointment will not take effect.

……………………………………………………………………………………..

(iv) The government of Sri Lanka is implementing "GEMI DIRIYA" Community Development programme.

……………………………………………………………………………………..

(v) The Coastal areas of the Island are the most developed port of the Country.

……………………………………………………………………………………..

(vi) The Western Province has the highest population density.

……………………………………………………………………………………..

(vii) Agriculture today needs the use of fertilizer and pesticides.

……………………………………………………………………………………..

(viii) Sri Lanka population stood at 17.4 million in 1992

……………………………………………………………………………………..

(ix) The government has recognized poverty and unemployment as major problems of the country.

……………………………………………………………………………………..

(x) Agriculture remains the backbone of the country's economy.

……………………………………………………………………………………..

13. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අම්පාර පැවැති ජනතා සත්කාර සේවාවේදි සම්පූර්ණයෙන් ම විසඳන ලද ගැටලු සංඛ්‍යාව 12,433 ක් බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පවසයි.

ජනතා සත්කාර සේවාව ඉකුත් 23 සහ 24 යන දිනයන්හි අම්පාර ඩී.එස්.සේනානායක ජාතික පාසලේදී පැවැති අතර එහි පළමු දිනය 23 දා සේවා භූමියට පැමිණි සංඛ්‍යාව 12096 ක් වූ අතර දෙවැනි දින (24) පැමිණි පිරිස 7983 කි.

මෙහිදී විසැඳීමට යොමු කරන ලද ගැටලුවලින් 1788 ක් වෙනත් අංශ වෙත යොමුකරන ලද අතර පසුව විසඳීමට තබා ගන්නා ලද ගැටලු සංඛ්‍යාව 1197කි. මෙසේ ඉදිරිපත් කරනු ලැබූ ගැටලු අතරින් ප්‍රතික්ෂේප වූ ගැටලු සංඛ්‍යාව 89 කි.

ප්‍රධාන සේවා සැපයුම් ආයතනවලින් සපයන ලද ප්‍රතිලාභ අතර රියැදුරු බලපත්‍ර හා මෝටර් රථ වාහන කටයුතුවලින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 712 කි. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 1270 කි. ඇස් කණ්ණාඩි ලබා දුන් ප්‍රමාණය 1500ක් වූ අතර උප්පැන්න විවාහ හා මරණ සහතිකවල තිකුත් කරන ලද සංඛ්‍යාව 322 කි. අයදුම්පත් ලබා ගත් සංඛ්‍යාව 1062 කි. ක්‍රීඩා උපකරණ කට්ටල 177 ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් බෙදා දුන් අතර ලංකා විදුලිබල මණ්ඩලය මගින් සී.එෆ්.එල්. විදුලි බල්බ 425 ක් ලබා දෙන ලදී.

ග්‍රාම සේවා නිලධාරින්ගේ රාජකාරි කටයුතු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මෝටර් සයිකල් යතුරු පැදි 126 ක් බෙදා දෙනු ලැබිය. ග්‍රාම නිලධාරින් සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ අත්‍යාවශ්‍ය සියලුම කාර්යාල උපකරණ කට්ටල 507 ක් ද, මධ්‍යම පංතික නිවාසලාභීන් සඳහා ඔප්පු ප්‍රදානයන් පහක් (5) සිදු කරනු ලැබිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් නිවාස ඉදිකරන්නන් සඳහා රුපියල් පනස්දහසේ චෙක්පත් විසි දෙනෙකුට ප්‍රදානය කෙරිණි. සමෘද්ධි ජෙනරාල් දෙපාර්තමේන්තුව සිව් දොර ශිෂ්‍යත්ව 400 ක් ප්‍රදානය කරන ලදී. ලංකා බැංකුවෙන් රුපියල් ලක්ෂ විස්සක මුදලක් වැය කර ගොවීන් සඳහා කෘෂි කාර්මික උපකරණ තොගයක් ලබා දුන් අතර මහජන බැංකුවෙන් රුපියල් ලක්ෂ 56 ක ණය මුදල් හා ගොවි උපකරණ ලබා දෙන ලදී.

නැගෙනහිර පිහිටි විහාරස්ථාන සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ 12 ක් තර්ජිත ගම්මාන ආශ්‍රිත විහාරස්ථාන හා අනිකුත් ආගමික ස්ථාන සඳහා විදුලිජනක යන්ත්‍ර 35ක් ප්‍රදානය කරනු ලැබූ අතර ඒවායේ වටිනාකම රුපියල් ලක්ෂ 16කි. වනජීවී දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටියදී ජීවිත හානිවලට ලක් වූ අය වෙනුවෙන් චෙක්පත් 33 ක් ලබා දුන් අතර එහි වටිනාකම එක්ලක්ෂ අසූහයදහසකි.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් රන්බිම හා වෙනත් බලපත්‍ර 1330 ප්‍රදානය කෙරිණි. ක්‍රිස්තියානි ළමා අරමුදල සඳහා පාසල් සිසුන් 100 කට උපකරණ ලබා දුන් අතර උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය තුළින් නිවාස 1000 ක් ද, අක්සන් එයිඩ් ජාත්‍යන්තර සංවිධානය මගින් නිවාස 49 ක් ද මෙහිදී භාර දෙන ලදී.

(i) ජනතා සත්කාර සේවාව සංවිධානය කළේ කවුද?

……………………………………………………………………………………..

(ii) එම සේවාව පැවැත්වුණේ කවර ස්ථානයකද?

……………………………………………………………………………………..

(iii) මෙහි දී ඉදිරිපත් කරන ලද ඇතැම් ගැටලු ප්‍රතික්ෂේප වුයේ ද?

……………………………………………………………………………………..

(iv) මෙහි තිබූ ප්‍රධාන සැපයුම් ආයතන මොනවාද?

……………………………………………………………………………………..

(v) ක්‍රීඩා උපකරණ බෙදා දෙන ලද්දේ කාටද?

……………………………………………………………………………………..

(vi) ග්‍රාම නිලධාරින් ලැබූ ප්‍රතිලාභ මොනවාද?

……………………………………………………………………………………..

(vii) වෙක්පත් ප්‍රදානය කෙරුණේ කාටද?

……………………………………………………………………………………..

(viii) කෘෂිකාර්මික උපකරණ බෙදා දෙන ලද්දේ කවුරුන් විසින්ද?

……………………………………………………………………………………..

(ix) ආගමික අංශයට මෙහිදී ලැබුණු ප්‍රතිලාභ කවරේද?

……………………………………………………………………………………..

(x) රන්බිම සහතික පත්‍ර ප්‍රදානය කෙරුණේ කවර දෙපාර්තමේන්තුවකින්ද?

……………………………………………………………………………………..